# ඊනියා සාම බලපෑම්

අද මෙරට සිදුවන දෑ පිළිබඳ ව ජනතාවගෙන් කරුණු වසන්කිරීමට වගකිවයුත්තන් ක්‍රියාකරනු දැකිය හැකි ය. මෙය බටහිර ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාජත්වය කියාපාන තවත් අවස්ථාවක් පමණකි. බටහිර ප්‍රජාතන්ත්‍රවාදයට අනුව පරමාධිපත්‍යය ඇත්තේ ජනතාවට ය. සියල්ලන්ට එක්රැස්වී කටයුතු කිරීමට හැකියාවක් නොමැති බැවින් ජනතාවගේ නියෝජිතයන් පාර්ලිමේන්තුව නම් ආයතනයකට පත්කර ඔවුන් ලවා ආණ්ඩුකිරීමේ කටයුතු කරවාගන්නේ යැයි කියැවෙයි. එය එසේ නම් ආන්ඩුකිරීම සම්බන්ධ කටයුතු ජනතාවට කියයුතු ය. එහෙත් ඒ පිළිබඳ තොරතුරු බොහෝවිට ජනතාවගෙන් සැඟවෙයි. ජනතාව පමණක් නොව ඇතැම් කරුණු කැබිනට් ඇමතිවරු ද නොදනිති. ජනතාවට පරමාධිපත්‍යය ඇතැයි කියන්නේ නම් ජනතාව ස්වාමියා යැයි පැවසෙන්නේ නම් ජනතාවට කරුණු නොකියන්නේ ඇයි? ජනතාව මෝඩයන් ලෙස සලකන බවත් ජනතාවට කරුණු දන්වීමෙන් ඇතැම් රහස් හෙළිවන්නේ යැයි බියක් ඇති බවත් ප්‍රසිද්ධ කරුණු වෙයි. පාර්ලිමේන්තුවට පත්කර යවා ඇති ඇතැමුන් ගැන සලකාබැලීමේදී නම් ජනතාව කෙතරම් මෝඩ වී ඇත්ද යන්න හෙළිවන නමුත් ඒ කරුණ නිසාම පරමාධිපත්‍යය ඇතැයි කියන්නවුන් අඳුරේ තැබීම සුදුසු ක්‍රියාවක් නො වෙයි.

ඊනියා සාම සාකච්ඡා පිළිබඳව විවිධ රාජ්‍යවලින් එල්ලවන බලපෑම් කිසිවක් ගැන කිසිවිටෙකත් ජනතාවට නො කියැවෙයි.දෙමළ ජාතිවාදය යන්න පසුගිය අවුරුදු විසිපහක පමණ කාලයක් තිස්සේ ජාත්‍යන්තරකරණය වී ඇතැයි බටහිර දේශපාලන විද්‍යාව ඉගෙනගත් හා උගන්වන දැනුමැත්තෝ අපට හරබර වචනවලින් කියා දෙති. මේ මොන බොරු දේශපාලන විද්‍යාවක් ද යන්න අපි දනිමු. බටහිරයන් කියන දේ ඒ සැටියෙන් ම ජනතාවට පැවසීම බුද්ධිමත්කමේ ලක්‍ෂණයක් නොව නිවටකමේ අංගයක් වෙයි. දෙමළ ජාතිවාදය ජාත්‍යන්තරකරණය වී ඇති බව සැබෑ ය. එහෙත් එය අද ඊයේ සිදුවූවක් නො වෙයි. එය ජාත්‍යන්තරකරණය වූයේ එහි ආරම්භයේ දී ම ය. එනම් ලන්දේසීන් විසින් මෙරටට දුම්කොළ වැවීම සඳහා දෙමළ ජනයා දකුණු ඉන්දියාව යැයි අද හැඳින්වෙන ප්‍රදේශයෙන් ගෙන්වනු ලැබූ දිනවල ය. ඒ අදින් අවරුදු තුන්සියයකට පමණ පෙර ය. අද යාපන අර්ධද්වීපයේ ජීවත්වන වැඩි පිරිසක් මෙලෙස ලන්දේසීන් විසින් හා පසුව ඉංගිරිසින් විසින් ගෙන්වනු ලැබූවන්ගෙන් පැවතෙන්නෝ වෙති. ඉදහිට හමුවන සෙල්ලිපියක් මගින් මෙරට දෙමළ ජනයා ඉතා ආදී කාලයේ සිට වාසය කර ඇතැයි පෙන්වීමට තැත්කිරීම, අනාගත ඉතිහාසඥයකු මෙරටින් හමුවන ජර්මන් හෝ ප්‍රංශ ආහාර පතක් බලා මෙරට ප්‍රංශයන් හා ජර්මානුවන් ජීවත්වී ඇතැයි නිගමනය කරනු වැනි ය. මෙරට එතරම් අතීතයකට යන දෙමළ ඉතිහාසයක් ඇත්නම් මෙරට ලියැවුණු එක දෙමළ කෘතියක් ගැන හෝ සාක්‍ෂියක් තිබිය යුතු ය. සීලප්පදිකාරම් වැනි දෙමළ කෘති ලංකාවේ ලියැවුණු පොත් නොවන බව බොහෝ දෙනාට අමතක ය. කවුරුන් මොන තරම් බෙගල් ඉතිහාසයට එකතුකිරීමට වෑයම්කළත් බොරු නොකළ හැකි දෙයක් වෙයි. අද යාපනයේ කතාකරන දෙමළ හා තමිල්නාඩුවේ කතාකරන දෙමළ අතර වෙනස අනුව ඒ භාෂා වෙන් වී අවුරුදු තුන්සියයකට වැඩි නො වෙයි.

ලන්දේසීන් විසින් ජාත්‍යන්තරකරණයෙන් ම ආරම්භකෙරුණු දෙමළ ජාතිවාදය අද වනවිට නෝර්වේ ප්‍රමුඛ ක්‍රිස්තියානි ස්කැන්ඩිනේවියානු රටවල් විසින් පවත්වාගෙන යනු ලැබෙයි. ඊනියා සාමකතා සඳහා බටහිරයෝ ආන්ඩුවට බලපෑම් දමති. මේ බලපෑම් ගැන ජනතාවට නො කියන්නේ ඇයි? සිංහල ජාතිකත්වයක කිසිදා නොසිටි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සිංහල විරෝධී ඇගේ සැමියා විසින් පිහිටුවනු ලැබූ මහජන පක්‍ෂයේ ප්‍රතිපත්ති දිගින් දිගට ම ගෙන යන්නේ බටහිරයන්ගේ හා මෙරට විජාතික බලවේගවල ආධාරයෙන් ය. ඇය මෙරටට ගෙන්වාගනු ලැබුයේ ද දෙමළ ජාතිවාදී කසිකබල් පත්තර කඩමාල්ලක කර්තෘකම කරන කසිකබල් ඊනියා ජනමාධ්‍යවේදියකු ඇතුළු කිහිප දෙනකු විසින් ය. ඇය බටහිරයන්ට අවශ්‍ය අන්දමට කටයුතුකිරීමට සූදානමින් සිටින්නී ය. එහෙත් සන්ධාන ආණ්ඩුවේ සියල්ලන්ට එසේ බටහිරයන්ට අවශ්‍ය අන්දමට කටයුතුකිරීමට හැකි ද? ශ්‍රී ල නි පක්‍ෂයේ සාමාජිකයන්ට අද පැවරී ඇති වගකීම නම් පක්‍ෂයේ නායකත්වය සුද්ද බුද්ද කිරීම ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ දේශපාලන ජීවිතය තව අවුරුදු දෙකකින් පමණ අවසන්වීමට නියමිත ය. ඉන්පසු ඇයට ජනාධිපති ධුරය හිමි නො වෙයි. ඇය ඉන්පසු දියවන්නා (දියවන?) පාර්ලිමේන්තුවට නොව තේම්ස් නදිය අසබඩ ලන්ඩනයට යැවීම රටේ සුබ සිද්ධියට හේතු වෙයි.

© Prof. Nalin De Silva

කුමාරතුංග මහත්මියගෙන් පසුව ශ්‍රී ල නි පක්ෂයේ නායකත්වයට සිංහලත්වය අගය කරන්නකු පත්කරගැනීමේ වැදගත්කම වෙයි. බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය විසින් මෙහෙයවෙන ඊනියා රාජ්‍ය නොවන සංවිධානවල ඉත්තෝ ඒ තනතුර සඳහා සුදුසු නො වෙති. මෙරට ජාතික නිදහස දිනාගැනීමේ කර්තව්‍යයට නායකත්වයක් දියහැකි පුද්ගලයකු මේ තනතුර සඳහා පත්කර ගැනීම පක්ෂයේත් රටේත් යහපතට ම හේතු වෙයි. මෙරට සිංහලයන්ගෙන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ගෙන් බහුතරය දිගින් දිගට ම මැතිවරණ කිහිපයක දී ම ප්‍රධාන වශයෙන් ම ශ්‍රී ල නි පක්ෂයටත්, ජනතා විමුක්ති පෙරමුණටත් ඡන්දය දී ඇත්තේ හුදු ආර්ථික කරුණු මත පමණක් පදනම් වී යැයි යමකු සිතන්නේ නම් ඒ මුළාවකි. ඒ පිරිස දෙමළ ජාතිවාදයටත්, දෙමළ ජාතිවාදය ආයුධයක් කරගනිමින් අප පාලනය කරන බටහිරයන්ටත් විරුද්ධ ව කටයුතු කිරීම අද මේ පක්ෂවලින් බලාපොරොත්තු වෙති. ඒ සඳහා ඒ පක්ෂ ජාතික මතවාදවලට පැමිණිය යුතු ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් ම බිහිකරනු ලැබූ ලිබරල්වාදී හෝ මාක්ස්වාදී හෝ මතවාද යොදාගනිමින් ඒ නූතනත්වයේ ම තවත් ප්‍රතිඵලයක් වූ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට එරෙහිව කටයුතු කළ නො හැකි ය. මේ නූතනත්වය අප මත උත්තරාරෝපණය කරන ලද්දක් යැයි බටහිර මතවාද විශේෂයක් පුනරුච්චාරණය කරන ඇතැම් අනුකාරකයන් පිරිසක් අපට කියාදෙති. ඒ මතය ප්‍රචාරයකරන්නේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය විසින් බලහත්කාරයෙන් අප මත බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පටවනු ලැබ ඇති බව වසන්කිරීමට ය. බටහිර නූතනත්වය මෙන් ම බටහිර නූතනවාදී මතවාද ද ඊනියා පශ්චාත්නූතනවාදී මතවාද ද බටහිර නූතනත්වය විසින් ම අප මත පැටවෙයි. ඒ ඒ මතවාද සඳහා විවිධ ඒජන්තයෝ මෙරට වෙති. (පශ්චාත්නූතනත්වය යනුවෙන් ප්‍රපංචයක් නැති බව ප්‍රපංචවේදයක් ගැන දොඩවන්නන් දැනගත යුතුව ඇත.)

ප්‍රභාකරන් යනු බටහිර ජනමාධ්‍ය හා මෙරට අනුකාරකයන් විසින් හඳුන්වා දෙනු ලැබ ඇති ආකාරයේ යුද්ධ දක්ෂයෙක් නො වෙයි. ඔහු පවත්වාගෙන යනු ලබන්නේ දෙමළ ජනයා විසින් නොව බටහිරයන් විසින් ය. ජලය විසින් රැකෙන මාළුවා මෙන් ගරිල්ලා භටයා ආරක්ෂා කෙරෙන්නේ ජනතාව විසින් ය යන කතාව එතරම් වැදගත් කතාවක් හෝ සාදෘශ්‍යයක් හෝ නො වෙයි. පළමුවෙන් ම මාළුවා ජලය විසින් නො රැකෙයි. මාළුවා ජලයේ ජීවත්වීම, ජලය විසින් රැකගනු ලැබීමක් නො වෙයි. කෙසේ වෙතත් ප්‍රභාකරන් වැන්නන් පවත්වාගෙන යනු ලබන්නේ ජනතාව විසින් නොව බාහිර සාධක විසින් ය. බටහිරයන් විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රභාකරන් අද ඊනියා සාම සාකච්ඡා සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස අන්තර්පාලන යෝජනා පිළිගැනීමට බලකරයි. මේ යෝජනා පිළිගන්නා ලෙස බටහිරයෝ විවිධ බලපෑම්කරති. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද ඒ පිළිගැනීමට සූදානම් ය. ඇගේ කැබිනට් මණ්ඩලයේ සිටින තිස්ස විතාරණ වැනි දෙමළ ජාතිවාදී ඇමතිවරු ද එයට එකඟ වෙති. තිස්ස විතාරණ මහතාට මෙරට කිසිම ඡන්ද කොට්ඨාශයකින් මනාප දාහක් ලබාගැනීමට නොහැකි බව ඊනියා විද්‍යාඥයකු යැයි කියන විද්‍යා ඇමතිවරයා සමහරවිට නොදන්නවා විය හැකි ය.

කවුරුන් කැමති වුවත් කවුරුන් බලපෑම් කරත් මේ යෝජනා නො පිළිගැනීමට ආණ්ඩුව කටයුතු කළ යුතු ය. අද ප්‍රභාකරන් මේ යෝජනාවල එල්ලී සිටීම මගින් බටහිරයන්ට ද කරදරයක් බවට පත්වෙමින් සිටියි. ප්‍රභාකරන් පරාජය කිරීමට හොඳ ම අවස්ථාවක් දැන් එළඹී ඇත. මොන බලපෑම් යටතේ වුව ද අන්තර්පාලන යෝජනාවලියට එකඟ නොවීමෙන් ප්‍රභාකරන් පරාජය කළ හැකි ය. ඒ සමග දෙමළ ජාතිවාදය පරාජය නොවුණ ද එය අඩපණ වනු ඇත. ඔහු බේරාගැනීම සඳහා බටහිරයන් සියළු ක්‍රම අනුගමනය කරනු ඇත. ඇතැම් විට අප මත ආර්ථික තහංචි සෘජුව හෝ වක්‍රව හෝ පැනවීමට ඉඩ ඇත. ඒ සඳහා ජනතාව සූදානම් කිරීම ආණ්ඩුවේ වගකීම වෙයි. එහෙත් ආණ්ඩුව ඒ වෙනුවෙන් කරන්නේ කුමක් ද? ජනතාවට කරුණු කියා ජනතාව සමග සටනට සූදානම්වනු වෙනුවට ආණ්ඩුව ජනතාවගෙන් කරුණු වසන්කරයි. අඩුම තරමින් ආහාර වගාවක් සඳහාවත් ජනතාව උනන්දුකිරීමක් දැන් නො සිදුවෙයි. ප්‍රභාකරන් පරාජය කළ හැක්කේ ජනතාව දැනුවත්කර ජනතාවගේ සහායෙන් මිස ඊනියා සාමලේකම් වැඩවලට ආනයනය කරනු ලැබූ බුද්ධිමතුන් යැයි කියාගන්නා බටහිර ගැත්තනගේ ආධාරයෙන් නො වෙයි. අප කෙලින් සිටින්නේ නම් බටහිරයන්ට වුව ද ප්‍රභාකරන් අත්හැරීමට සිදුවනු ඇත. බටහිරයන් තම අවශ්‍යතා සඳහා යමකු යොදාගන්නේ ඒ පුද්ගලයා තම න්‍යාය පත්‍රයට පටහැණි නොවන ආකාරයකට කටයුතු කරන්නේ නම් පමණකි. අද ප්‍රභාකරන් බටහිරයන්ගේ අවශ්‍යතාවලට ද බාධකයක් බවට ක්‍රමයෙන් පත්වෙමින් සිටියි. ඔහු පැරදවීමට කළ යුත්තේ එකම එක කාර්යයක් පමණකි. ඒ සියළු බලපෑම් මධ්‍යයේ ඉන්ද්‍රඛීලයක් මෙන් නොසැලී සිටීම ය. එසේ කරන්නේ නම් ආණ්ඩුවට බහුතර සිංහලයන්ගේ සහාය ලැබෙනු ඇත ~

© Prof. Nalin De Silva